14

බුදු දහමෙන් ඇගයෙන සහජීවනය

ඒ මගේ ජීවිතයේ වඩාත් ම ප්‍රීතිමත් දිනයයි. මා වාගේ ම, මගේ අම්මාත් තාත්තාත් වඩාත් ම සතුටු වූ දිනය එදායි. එය අප විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයයි. පන්තියේ කවුරුවත් හිතුවේ නෑ මට වටිනා තෑග්ගක් ලැබෙයි කියලා. මම ක්‍රීඩාවට දක්ෂත් නෑ. මට අනෙක් ළමයින් එක්ක දුවලා දිනන්නත් බැහැ. අනිකුත් ක්‍රීඩා ඉසව්වලට ඉදිරිපත් වෙලා දිනන්නත් බැහැ. මා ඉගෙනීමේ කටයුතුත් මහන්සිවෙලා කළාට මොක ද අනෙක් ළමයින් මට වඩා දක්ෂයි. මම කොච්චර මහන්සි ගත්තත් පළමුවෙනියා දෙවෙනියා තියා විසිපස් වෙනියාගෙන් ඉස්සරහට නම් යන්න බැරිවුණා. කොහොම වුණත් මම හැමදාම පාසල් යන එකනම් කඩ කළේ නැහැ. සෑම අවස්ථාවක ම අනෙක් යහළුවනුත් එක්ක සමගියෙන් කටයුතු කළා.

අපේ පාසල මිශ්‍ර පාසලක් නිසා ගැහැනු පිරිමි දෙපිරිස ම ඉගෙන ගන්නවා. ඒ වගේ ම මුස්ලිම් ළමයින් කිහිප දෙනෙකුත්, දමිළ ළමයින් කිහිප දෙනෙකුත් පන්තියේ ඉන්නවා. ක්‍රිස්තියානි, කතෝලික, ඉස්ලාම්, හින්දු හැම ආගමේ ම අය අපේ පන්තියේ ඉගෙන ගන්නවා. ඒ ඔක්කොම මගේ යාළුවෝ. සමහර දාට අපි කෑම කන්නෙත් එකට. පන්තියේ සමහර ළමයින් නොයෙක් වැරැදි වැඩ කරලා

ගුරුවරුන්ගෙන් බැණුම් අහපු අවස්ථා තිබුණා; දඬුවම් විඳපු අවස්ථාත් තිබුණා. ඒත් මම කවදාවත් එහෙම බැණුම් අහන, ගුටිකන වැඩ නම් කරලා නැහැ. මම පන්තියේ ළමයි එක්ක සමගියෙන් කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. අපේ පාසලේ තියෙන බුදු මැදුරට පූජා කරන්න මම හැම දා ම මල් රැගෙන යන්නත් අමතක කළේ නැහැ. අම්මට බුදුන් වඳින්න තාත්තා ගෙනත් දීල තියෙන හඳුන්කූරු පෙට්ටිවලින් සමහරදාට හඳුන්කූරුත් අරගෙන යනවා. එහෙම කරගෙන ඉන්න අතරේ තමයි මට පාසලේ හැසිරීමෙන් හොඳ ම ශිෂ්‍යයාට හිමි සම්මානය හිමි වුණේ. මම නම් කවදාවත් හිතුවේ නෑ මට එහෙම වාසනාවක් තිබෙයි කියලා. එදා මට ඒ සම්මානය දෙන්න කලින් අපේ පාසලේ අනුශාසක ස්වාමීන් වහන්සේ හොඳ දේශනයකුත් කළා. මට ඒ කතාව තාමත් ඇහෙනවා ඇහෙනවා වගේ.

පින්මඳ පුතුන් සියයක් ලදුවත්	**නිසරු**
ගුණ නැණ බෙලෙන් යුතු පුතු ම ය ඉතා	**ගරු**
එක පුත් සඳින් දුරුවෙයි ලොව ගණ	**අඳුරු**
නෙක තරු රැසින් එලෙසට නොම වේ ය	**දුරු**

"මේ කවිය මෙහි සිටින වැඩිහිටියන් මෙන් ම ළමයිනුත් බොහෝ විට අසා ඇති. පින්මඳ පුතුන් කීවා ම දුවලා හිතන්න පුළුවන් අපි ගැන සඳහනක් නැද්ද කියලා. මෙහි පුතුන් කියලා කියන්නේ දුවල පුතාලා සියලු දෙනාටමයි. පින් අඩු දරුවන් කියන්නේ කවුද කියන එක දෙවැනි පදයෙන් හොඳට පැහැදිලි වෙනවා. අප සමාජයේ පින් තියෙන ඇත්තන් විදියට සිතන්නේ සල්ලි මිල මුදල් තියෙන අය ගැනයි. මෙහි පින් ඇති දරුවන් ලෙස සැලකෙන්නේ ගුණ නැණ තියෙන අයයි. ගුණ නුවණ නැති දරුවන් සියයක් ඉන්නවට වඩා ගුණවත්කමින් හා නැණවත්කමින් යුතු එක් දරුවෙක් වටිනා බව මෙයින් කියවෙනවා. මෙහි ලස්සන උපමාවකුත් පෙන්නල තියෙනවා. කොච්චර අහසේ තරු තිබුණත් අන්ධකාරය දුරුවෙන්නේ නැහැ. එහෙත් එක ම එක හඳ පැව්වොත් ඇති. රටේම අන්ධකාරය දුරු වෙනවා. ඒ වගේ තමයි ගුණ නුවණින් යුතු එක දරුවෙක් හිටියොත් ඒක මවුපියන්ට පමණක් නොවෙයි රටට ම ආලෝකයක් වෙනවා.

"අද අපේ පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය. පන්ති කාමරයේ දී එක් එක් විෂයයන්ගෙන් දක්ෂතා දැක්වූ දරුවන්ට මෙන් ම ගීත ගායනයෙන්, වාදනයෙන්, නර්තනයෙන්, ක්‍රීඩාවෙන් දක්ෂතා දැක්වූ දරුවන්ටත් තෑගි

භෝග සමග සහතිකපත් හිමි වෙනවා. මේ අතර විශේෂ තෑග්ගක් තියෙනවා. ඒක දෙන්නේ ඔය මං ඉහතින් සඳහන් කරපු එක ම එක දෙයක් ගැනවත් සලකා නොවෙයි. ඒ තෑග්ග අපි නම් කරලා තියෙන්නේ වසරේ හොඳ ම ශිෂ්‍යයාට හෝ ශිෂ්‍යාවට දෙන තෑග්ග ලෙසයි. මෙහි ඇති විශේෂත්වය වන්නේ දක්ෂතම කෙනා මේ සඳහා නොතේරීමයි. බොහෝ තරගවල දක්ෂතම කෙනාට දෙන තෑගි අපි දැකලා තියෙනවා. ඒත් අපි මේ තෑග්ග දෙන්නේ දක්ෂයාට නොවේ; හොඳ ම කෙනාටයි. සමහර විට දක්ෂයා හොඳ ම කෙනා වෙන්නත් පුළුවන්, නොවෙන්නත් පුළුවන්. කොපමණ දක්ෂතා තිබුණත්, උගත්කම් තිබුණත්, ගුණවත්කම් නැත්නම් ඒ උගත්කමෙන් පලක් වෙන්නේ නැහැ. මේ දරුවා තේරීමේදී අවධානය යොමු කළ එක් අංශයක් තමයි සහජීවනය.

"කිසි යම් සමාජයක අන්‍යෝන්‍ය උපකාරය සහයෝගය ඇති ව, සමගියෙන් එක් ව ක්‍රියා කිරීම සහජීවනය ලෙස හඳුන්වන්න පුළුවන්. සමාජයේ ආගමික කටයුතුවල දී, ගොවිතැන් කටයුතුවල දී, මංගල අවමංගල කටයුතුවල දී මෙන් ම සමාජ සුභසාධන කටයුතුවල දී සහයෝගයෙන් කටයුතු කරනවා. කෙනෙකුගේ සැපතේ දී මෙන් ම විපතේ දී ද එක් ව ක්‍රියා කිරීම අපේ සිරිතක්. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ආදී උතුම් ගුණාංගවලින් යුතු ව අන්‍යයන් ට උදව් කිරීම අපේ සම්ප්‍රදායයි. එහෙත් අද අපට පෙනෙන දෙයක් තමයි ලෝකයේ ම මිනිසුන් නොමිනිසුන් වෙලා ජාතිවාදී ව, ආගම්වාදී ව, කුලවාදී ව, නොයෙක් අරගල ඇති කර ගන්නවා. යුද්ධ කරගෙන එකිනෙකා මරාගන්නවා. මම හිතන්නේ මේකට හොඳ ම විසඳුම අප ළඟ තිබෙනවා. ඒ බුදු දහමයි. බුදු දහමෙහි උගන්වන මානව දයාවයි. කරුණාවයි. ඒ අනුව ගොඩනගා ගන්නා සහජීවනයයි.

"එදා බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන අවධිය වන විටත් භාරතීය සමාජයේ කුලය නිසා, ආගම නිසා මිනිසුන් බෙදී වෙන් වී සිටියා. බුදුරජාණන් වහන්සේ එම විරුද්ධවාදිකම් පිටු දකිමින් සමානාත්මතාවාදී ව ධර්මය දේශනා කළා. උන් වහන්සේ බොහෝ අවස්ථාවල අන්‍ය ආගමික ස්ථානවලටත් වැඩම කළා. ඔවුන් සුහදව ඇසුරු කළා. බෞද්ධයින් හැමදාමත් සිය ආගම ධර්මය අනුව අවිහිංසාවාදී ව ක්‍රියා කළා. ආගම වෙනුවෙන් කෙනෙකුට හිරිහැරයක් කළේ නැහැ. ලෝකයේ ආගම වෙනුවෙන් කළ යුද්ධ පිළිබඳ සිදුවීම් කොතෙකුත් අපට අහන්නට දකින්නට ලැබෙනවා. එහෙත් බුදු දහම වෙනුවෙන් කිසි දාක අපි යුද්ධ කරලා නැහැ කියලා සතුටින් කියන්න පුළුවන්.

"අද ලෝකයේ මිනිසුන් ආගමික වශයෙන් බෙදී සිටිනවා. ජාති වශයෙන් බෙදී සිටිනවා. රටවල් වශයෙන් බෙදී සිටිනවා. හැබැයි අපි ඔක්කොම මිනිසුන් බව අමතක වෙලා. උපතින් කිසි ම කෙනෙක් උසස් වෙන්නේ හෝ පහත් වෙන්නේ හෝ නැති බව බුදු හාමුදුරුවෝ අපට පැහැදිලි කළා. **ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී** යන පංච මහා ගංගාවලින් එන ජලය මහ සමුද්‍රයට වැටී එක ම ලුණු රසයක් වෙනවා සේ ම බුද්ධ සාසනය තුළ දී සියලු දෙනා ද එක ම පිරිසක් බවට පත්වෙන බව උන් වහන්සේ දේශනා කළා.

"සමහර උදවිය ජාතිය වෙනුවෙන්, ආගම වෙනුවෙන් කුලය වෙනුවෙන් විරසක වෙනවා. අපට අසනීපයක් සෑදුණාම දෙන බෙහෙත් සිංහල අයට දෙන බෙහෙත්, දෙමළ අයට දෙන බෙහෙත්, මුස්ලිම් අයට දෙන බෙහෙත් කියා වෙනසක් තිබෙනවා ද? නැහැ. ඔක්කෝට ම එක ම විදිහට ලෙඩ රෝග හැදෙනවා. ඒවාට එකම බෙහෙත් දෙනවා. හැම දෙනාට ම එක ම ආකාරයට බඩගිනි හැදෙනවා. පිපාසය හැදෙනවා. කෑමට ගන්නා දේවල්, බොන දේවල් වෙනස් වෙන්න පුළුවන්. හැබැයි මොනවා කෑවත්, මොනවා බීවත් අපේ ශරීරයේ තියෙන්නේ එක ම අවයව නොවෙයි ද? එක සමාන ලේ වර්ග නොවේ ද? කාට හරි අසනීපයක් සෑදුණාම සිංහල කෙනාගේ ලේ මුස්ලිම් අයට දෙනවා. මුස්ලිම් අයගේ ලේ දෙමළ අයට දෙනවා. දෙමළ කෙනාගේ ලේ සිංහල අයට දෙනවා. අපි කවුරුවත් අපේ ජාතියේ ලේ ඕනයි කියා හොයන්නේ නැහැ. එහෙම දෙන්නෙත් නෑ. ඒකෙනුත් පේනවා අපි ඔක්කොම මිනිසුන් කියා. අපි සියලු දෙනා සමානයි කියා.

"ඒ වගේ ම අපි අන්‍යයන්ගේ මත ඉවසීමට පුරුදු විය යුතුයි. තමාගේ දේ තමයි නිවැරැදි, අනිකාගේ දේ වැරැදියි කියා අවමන් නොකළ යුතුයි. අන්‍යයන්ගේ හොඳ දේ ඇතොත් අප ඒ දේ අගය කිරීම කළ යුතු ය. තමාට පිළිගත නොහැකි, එකඟවිය නොහැකි දෙයක් ඇත්නම් එය උපහාසයට ලක් නොකළ යුතුයි. සමහර ජාතීන්ට, ආගම්වලට අයත් විශේෂතා තියෙනවා. ඒවා සමහරවිට අපේ බෞද්ධ සංස්කෘතිය හා නොගැළපෙනවා විය හැකියි. එවැනි දේ ඉවසීමත් හොඳ මිනිස් ගතියක් බවයි. ශ්‍රී ලාංකේය බෞද්ධයා සලකන්නේ. ඉවසීමේ වැදගත්කම පිළිබඳ කවියක් ඔය දරුවන් අසා ඇති.

ඉවසන දනා රැපු යුදයට ජය	කොඩිය
මහමෙර උසුලනා මිහි කතටත්	වැඩිය
ලොව සැම දෙනා ගෙන් ඔහු උතුමෙකි	වැඩිය
යළි ඒ සුදන සැප සේ සුර පුර	වැඩිය

"අපි අද දින ප්‍රදානය කරන ත්‍යාගය සඳහා හැසිරීමෙන් හොඳ ම ශිෂ්‍යයා තෝරා ගත්තේ බොහෝ කරුණු පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙන් පසුවයි. ඔය දරුවො දන්නේ නැති වුණාට අපේ ගුරුවරු ඔය දරුවන්ගේ ක්‍රියා කලාප පිළිබඳ හොඳින් අධ්‍යයනය කළා. හැම දෙනා සමග සහයෝගයෙන් කටයුතු කරන, සමානාත්මතාව අගය කරන, ජාති, කුල, ආගම් නොසලකා වැඩ කරන, අනතිමානී, අවිහිංසාවාදී, ගුණගරුක දරුවා කවුද කියන එක පිළිබඳ අප විමසා බැලුවා. ඒ අනුව අප පාසලේ හොඳ ම ශිෂ්‍යයා හැටියට අපි තෝරාගෙන තිබෙන්නේ හත ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන සහන් ප්‍රසාද් පුතා. මම මතක් කරනවා ඒ පුතාගේ අම්මයි තාත්තයි දෙන්නත් එක්ක මේ සභාවේ ඉදිරියට එන්න කියලා."

නම කියනවා ඇහෙනකොට මට ඇතිවුණ සතුට කියාගන්න බැරි තරම්. ඊට පස්සේ අපේ අනුශාසක ස්වාමීන් වහන්සේ මොනවා දේශනා කළා ද කියලා මට මතකත් නැහැ. "අපේ අනෙක් දෙමාපියන්ටත් මේ දරුවා හොඳ ආදර්ශයක්. මේ දරුවා වගේ දරුවන් හදාගන්න අනෙක් අයත් වෙහෙස ගන්න ඕනෑ" යි කියා කියනවා ඇහුණා විතරයි මතක.

සාරාංශය

මේ ලෝකයේ ජීවී අජීවී සෑම දෙනාට ම අප ආදරය කළ යුතු ය. මුළු මහත් ප්‍රජාව ම එක ම මවකගේ දරුවන් ලෙස සිතා කටයුතු කිරීම කොතරම් අගනේ ද? ජාති, ආගම්, කුල වශයෙන් බෙදී කටයුතු නොකොට සියලු දෙනා එකාවන් ව සිතීමට බුදුරජාණන් වහන්සේ අපට උගන්වා ඇත. එසේ කටයුතු කිරීම අප සෑම දෙනාගේ ම වගකීමකි.

ක්‍රියාකාරකම

1. ලෝකයේ මිනිසුන් අතර භාෂාව, ශරීර වර්ණය, ආගම ආදී වෙනස්කම් ඇතත් සියලු දෙනා ම සමාන ය. මේ පිළිබඳ ඔබ කරන කතාවේ පිටපත ලියන්න.

2. "අපි සැම ලක් මෑණියන්ගේ එක ම දරුවන් පිරිසක් වෙමු" මාතෘකාව යටතේ පද්‍යයක් නිර්මාණය කරන්න.

පැවරුම

ආගමික හා ජාතික සමගිය ගැන රචනා වී ඇති පුවත්පත් වාර්තා හෝ පොත් පත්, සඟරාවල ඇති ලිපි හෝ සොයා එකතු කර පොතක් සාදන්න.